# සෙල්ලිපිවලින් හෙළිදරව්වන ඉපැරණි ශ්‍රී ලංකාවේ බැංකු ක්‍රම හා පොලී අනුපාත


**කේ. එම්. ඇලෙක්සැන්ඩර්**
**ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**
***alexkapu39@yahoo.com***



ශ්‍රී ලංකාවේ ඓතිහාසික, සමාජ, ආර්ථික හා දේශපාලනික ආදී වූවිවිධාකාර තොරතුරු අධ්‍යයනයේ දී පැරණි සාහිත්‍යමය හා පුරාවිද්‍යාත්මක සාධක වලින් ලැබෙන්නේ නොබඳ පිටුබලයකි. පුරාවිද්‍යාත්මක සාධක අතුරින් සෙල්ලිපි වලටමෙහි දී සුවිශේෂ වැදගත් කමක් ලැබේ. අනුරාධපුර යුගයේ ක්‍රි.ව.4 වන සියවසට අයත් ශ්‍රී මේඝවර්ණ රාජ්‍යකාලයට අයත් තෝණිගල පර්වත ලිපිය ඉපැරිණි ශ්‍රී ලංකාවේ බැංකු ක්‍රම හා පොලී අනුපාත පිළිබඳව ඉතාම පැහැදිලි තොරතුරු රාශියක් අනාවරණය කරයි. ඊට අමතරව මුදල් තැන්පත්කර පවත්වාගෙන ගිය බැංකු හා සම්බන්ධ තොරතුරු ද අනුරාධපුර යුගයට අයත් ශිලාලේඛන වල සඳහන්වේ.

ලෝකයේ පැරණිම සමාජ සංවිධානවල ආර්ථික තොරතුරු සාකච්ඡාකිරීමේ දී මුලින්ම දක්නට ලැබෙන්නේ භාණ්ඩ හුවමාරු ක්‍රමයයි. එහි දී ඔවුන් ධාන්‍ය වලට ඉතා වැදගත් කමක් ලබාදී තිබුණි. අනුරාධපුර යුගයේ ද ධාන්‍යවලට ඉතා සුවිශේෂ වැදගත් කමක් ලැබුණුබව එම යුගයේ කෘෂිකාර්මික ජීවනරටාව හා එහි දියුණුව පිළිබඳ අපේ පැරණි සාහිත්‍ය හා ශිලාලේඛන තොරතුරු වලින් ඉතා හොඳින් පැහැදිලිවේ. ඒ අනුව තෝණිගල ශිලාලේඛනයෙන් හෙළිදරව්වන්නේ ඉපැරණි ශ්‍රී ලංකාවේ අනුරාධපුර යුගයේ ධාන්‍යමත පදනම්කර ගත් ඉතා විශිෂ්ඨ ගණයේ බැංකුවක් පිළිබඳවය.

සෙල්ලිපියේ සඳහන් ආකාරයට එම බැංකුවේ තැන්පත්කර ඇත්තේ වී, මුං හා උඳු යන ධාන්‍ය වර්ග තුනයි.

ඒ අනුවබලන කල ඉතාමත් පැහැදිලි ආකාරයට මේ පොලී අනුපාත හා බැංකු කළමනාකරණ පිළිබඳ වැදගත් තොරතුරු රැසක් තෝණිගල සෙල්ලිපියෙන් අනාවරණයකර ගත හැකිවේ. එබැවින් ආර්ථික කටයුතු හා සම්බන්ධ ඉපැරණි එම වැදගත් තොරතුරු වත්මන් සමාජයට අනාවරණ කරදීම මෙහි ප්‍රධාන අරමුණයි.



***ප්‍රමුඛ පදඃ*** *ඉපැරණි බැංකු ක්‍රම, පොලී අනුපාත, බැංකු කළමනාකරණ*